# ධම්මපදය

## චිත්ත වර්ගය (11 ගාථාව)

**11.** ගාථාව

**"න තං මාතා පිතා කයිරා - අඤ්ඤේ වා'පි ච ඤාතකා**
**සම්මාපණිහිතං චිත්තං - සෙය්‍යසෝ නං තතෝ කරේ"ති.**

පදාර්ථය

| | | |
|---|---|---|
| **තං** | - | (සගමොක් සුව ගෙන දෙන යම්) ඒ කාරණය |
| **මාතා** | - | මවු තොමෝ |
| **න කයිරා** | - | නො කරන්නී ය. |
| **පිතා** | - | පිය තෙමේ ද |
| **න කයිරා** | - | නො කරන්නේ ය. |
| **අපි ච** | - | තව ද |
| **අඤ්ඤෙ** | - | අනෙකුදු |
| **ඤාතකා වා (න කරෙය්‍යුං)** | - | නෑයෝ හෝ (නො කරන්නාහු ය) |
| **සම්මා** | - | (දස කුසලයන්හි) මනාකොට |
| **පණිහිතං** | - | පිහිටුවන ලද |
| **චිත්තං** | - | සිත |
| **තතො** | - | ඒ හේතුවෙන් |
| **නං** | - | ඒ පුද්ගලයා |
| **සෙය්‍යසෝ** | - | ඉතා උතුමෙකු |
| **කරේ** | - | කරන්නේ ය |

භාවාර්ථය

මනා ව පිහිටුවා ලූ සිත උතුම් යහපතක් ම සිදු කරයි. එබඳු යමක් මවු ද පියා ද නො කරන්නාහ. අනික් නෑයෝ ද නො කරන්නාහු ය.

නිදාන කථාව

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙර වැඩවසන සමයෙහි එක් දවසෙක සෝරෙය්‍ය සිටුපුත් තෙමේ යහළුවකුත් සමග සැප පහසු ඇති රියෙක නැඟී මහපිරිවරින් වතුර නෑමට නුවරින් නික්ම ගියේ ය. එවේලෙහි මහාකච්චායන මහරහතන් වහන්සේ පිඬු සිඟා යන්නට නුවරින් පිටත සිට සිවුරු පෙරවූහ. සිටුපුත් එම තෙරුන්වහන්සේගේ රන්වන් සිරුර දැක 'මේ ස්ථවිර තෙමේ මාගේ අඹුව වන්නේ නම්, නැතහොත් මාගේ බිරියගේ සිරුරු පැහැය මේ ස්වාමීන් වහන්සේගේ සිරුරු පැහැය සේ වන්නේ නම් යෙහෙකැ' යි සිතී ය. එකෙනෙහි ම ඔහුගේ පිරිමි බව අතුරුදහන් ව ස්ත්‍රීභාවය පහළ විය. එයින් හටගත් ලැජ්ජා සිත් ඇත්තේ ඔහු රියෙන් බැස පලා ගියේ ය.

පිරිවර ජනයා මේ කිසිත් නො දැන නුවරට යන මගට බැස්සාහ. යහළුවා ද ඈ ගිය අතක් නො දන්නේ ය. සිල්ලෝ ම වතුර නා ගෙවලට ගියහ. ගෙවල වැස්සෝ 'සිටුපුත් කොහි දැ' යි ඇසූහ. 'වතුර නා ගෙට ආවේ ය'යි සිතුම්හ' යි ඔවුහු කීහ. එකල ඔහුගේ මවුපියෝ ඒ ඒ තැන සොයා බලා නො දක්නෝ ඔහු මළේ ය යි සිතා මළ-බත් දානය දුන්හ.

ස්ත්‍රී බවට පත් ව පැනගිය ඕ තොමෝ තක්සලා නුවර යන ගැලක් පස්සේ ගියා ය. ගැලෙහි හුන් මිනිස්සු ඇය දැක 'අපගේ ගැල පස්සේ එන මේ තරුණිය කවු දැ'යි නො දනුම්හ' යි කීහ. ඕ තොමෝ මෙසේ පයින් මඳ දුරක් ගොස් ඇඟිල්ලක තිබූ මුද්දක් ගලවා දී ගැලක යන්නට ඉඩ ලබා ගත්තා ය. ඒ ගැලෙහි යන සෙස්සෝ 'තක්සලාවෙහි අපගේ සිටුපුත්‍රයාහට භාර්‍යාවක් නැත. මේ වග ඔහුට කිව යුතු ය. එවිට අපටත් පඬුරු කිසිවක් ලබා ගත හැකි ය' යි සිතා, එහි ගොස් 'ස්වාමීනි, ඔබතුමාට ගැළපෙන ස්ත්‍රීරත්නයක් අප විසින් ගෙනෙන ලද්දේ ය. ඇය පිළිගනු මැනවැ' යි දන්වා සිටියහ. සිටුපුත් තෙමේ එය අසා සතුටු ව ඇය කැඳවා බලා 'මෝ මට ම ගැළපෙන වයස් ඇත්තී ය. රූප ලක්ෂණයෙන් යුක්ත ය. දුටු පමණින් සිත් සතුටු කරන්නී ය' යි සිතා බලවත් සෙනෙහසින් සිය බිරිය කර ගත්තේ ය.

සසර දී පුරුෂ ව සිට ස්ත්‍රී බවට ද ස්ත්‍රී ව සිට පුරුෂ බවට ද පත් නො වූ කෙනෙක් නැත. පුරුෂයෝ පරඹුවන් සේවනය කොට මිය ගොස් ලක්‍ෂගණන් අවුරුදු නරකයෙහි දුක් විඳ, පසු කලෙක මනුෂ්‍ය ව උපදින්නෝ නම්, අත්බව් සියයක ම ගැහැණු ව උපදින්නෝ ය. ආනන්ද ස්ථවිරයන් වහන්සේ ද කල්ප ලක්‍ෂයක් පිරූ පෙරුම් ඇති ශ්‍රාවකයෙක් ව සසර සැරිසරා එන්නෝ එක් අත්බවෙක කඹුරු කුලයක

උපන්නෝ පරඹුවන් සේවනය කොට නිරයෙහි ඉපිද දුක් විඳ ඉන් ච්‍යුත ව මිනිස් ලොව උපන්නෝ කර්මාවශේෂයෙන් තුදුස් අත්බවෙක අනුන්ට අඹු ව ගැහැණු ව උපන්හ. සියක් අත්බවෙක අණ්ඩච්ඡේදයට පැමිණියහ. ගැහැණු වනාහි දනාදි පුණ්‍යකර්ම කොට ගැහැණු බවෙහි ආලය හැර 'අප කළ මේ පින් පිරිමි බව ලැබීම පිණිස හේතු වේවා' යි සිතින් ඉටා ගෙන කලුරිය කළෝ නම් පිරිමි ව උපදින්නෝ ය. හිමියා දෙවි කොට සලකා හිමියා කෙරෙහි මනාකොට පිළිපැදීමෙන් ද පිරිමි බව ලැබේ. මේ සිටුපුත් තෙමේ මහාකච්චායන තෙරුන් කෙරෙහි නො මගින් සිතා මේ අත්බවෙහි දී ම ගැහැණු බව ලැබුවේ ය.

තක්සලා නුවර සිටුපුතු සමග එකතු වීමෙන් ඇයගේ කුසෙහි ගැබක් පිහිටියේ ය. ඈ දස මසකට පසු පුතෙකු ලබා ඔහු පයින් ඇවිදින කල්හි තවත් පුතෙකු ලැබුවා ය. මෙසේ ඇයගේ කුසයෙහි උපන් දරු දෙදෙනා හා සෝරෙය්‍ය නුවර දී තමන් නිසා උපන් දරු දෙදෙනා ය'යි ඇයට දරුවෝ සිවුදෙනෙක් වූහ.

මේ අතර ඇයගේ පෙර යහළු වූ ඒ සිටුපුත් තෙමේ ගැල් පන්සියයක් ගෙන සෝරෙය්‍ය නුවරින් සැප පහසු ඇති ගැලක නැඟී තක්සලා නුවරට ගියේ ය. ඒ වේලෙහි ගෙයි උඩුමහලේ ජනේලයක් හැර මග බලමින් සිටි ඕ තොමෝ ඔහු දැක හැඳින සේවිකාවක යවා ගෙන්වා උඩුමහලේ ම හිඳුවා සැලකිලි කළා ය. එවිට සිටුපුත් 'ඔබ මීට පෙර කිසිදිනෙකත් අප විසින් නො දක්නා ලදී. නමුත් අපට බොහෝ සත්කාර කරහි. ඔබ අප හඳුනන්නෙහි ද' යි ඇසී ය. 'එසේ ය, මම ඔබව හඳුනමි. ඔබ සෝරෙය්‍ය නුවර වැසියෙක් නො වෙහි ද' යි ඇසූ විට, 'මම සෝරෙය්‍ය වැසියෙක්මි' යි කියා ඔහු පිළිතුරු දින. ඉක්බිති ඕ තොමෝ මවුපියන්ගේ ද බිරිඳගේ ද දරුවන්ගේ ද සැප දුක් විචාළා ය. ඔහු සැමදෙනාගේ ම සුවදුක් කියා 'ඔබ ඔවුන් හඳුනන්නෙහි ද' යි ඇසීය. ඕ, 'එසේ ය, හඳුනමි. ඔවුන්ට එක් පුත්‍රයෙක් ඇත. ඔහු කොහි ද' යි ඇසුවා ය. 'එහි විස්තර බොහෝ ය. අපි දවසක් ඔහු සමග ගැලක නැඟී නාන්නට ගියෙමු. එහි දී ඔහු නො පෙනී ගිය බැවින් අපි වටපිට සොයා බැලීමු. එහෙත් ඔහු දක්නට නො ලැබුණේ ය. එවිට අපි ඒ වග ඔහුගේ මවුපියන්ට දැන්වීමු. ඔවුහු ද සොයා බලා 'ඔහු මළේ ය'යි සිතා මතක බත් දනක් දුන්හ' යි කීය. ඒ වේලේහි ඕ 'ඒ මම වෙමි' යි කියා ඔහුට සියලු තොරතුරු කීවා ය.

යහළු සිටු තෙමේ විස්මිත ව, "මහතෙරුන් වහන්සේ ක්ෂමා කරවා ගැනීම වටී ය" යි කියා, එදවස තෙරුන්වහන්සේ එනුවර වැඩවසන බව දැන ආරාධනා කොට දනය පිළිගන්වා සියලු ප්‍රවෘත්තිය දැන්වී ය. පසුව ඕ තොමෝ මහාකච්චායන ස්ථවිරයන් වහන්සේගෙන් ක්ෂමාව අයැද පාමුල වැතිර සිටියා ය.

'එසේ නම් නැඟී සිටුව, ක්ෂමා කෙරෙමි' යි කියා තෙරුන් වහන්සේ වදාළ සේක. එකෙණෙහි ම ඇයගේ ස්ත්‍රී ලක්ෂණ නැති ව ගොස් පිරිමි ලක්ෂණ පහළ විය.

හෙතෙම මේ හේතුවෙන් සසර කලකිරුණේ මහාකච්චායන ස්ථවිරයන් වෙත සෝරෙය්‍ය නමින් පැවිදි විය. පසු ව සැවැත් නුවරට පැමිණ මහණදම් කෙරෙයි. දනව්වැස්සෝ මේ පුදුම සිදුවීම අසා, ඒ භික්ෂුව කරා ගොස් පුතුන් සතර දෙනාගෙන් කවුරුන් කෙරෙහි වැඩි සෙනෙහසක් පවතී ද'යි විමසූහ. එවිට තම කුසින් උපන් දරුවන් කෙරෙහි ය යි කියා පිළිතුරු දුන් සේක.

පසු කලෙක ඒ භික්ෂූන් වහන්සේ විදසුන් වඩා රහත් වූහ. රහත් වූ පසු දරුවන් ගැන විචාළ අයට පැවසුවේ කිසිවෙකුටවත් සෙනෙහසක් නැත කියා යි.

භික්ෂූහු මෙම කරුණ බුදුරජාණන් වහන්සේට දැන්වූහ. බුදුරජාණන් වහන්සේ 'ඒ භික්ෂුව රහත් වූ තැන් පටන් කිසි කෙනෙකුන් කෙරෙහි ප්‍රේමයක් නැතැ'යි වදරා මේ ගාථාව වදාළ සේක.

ධර්මදේශනාව අවසානයෙහි බොහෝදෙනා සෝවාන් ඵලාදියට පැමිණියහ. දේශනාව මහජනයාට වැඩ සහිත විය.

සාධු ! සාධු !! සාධු !!!

ශ්‍රී සද්ධර්ම සංසදය
ධම්මාරාම යෝගාශ්‍රමය
**(උඳුවප් 2551)**

ආත්මෝපදේශය - මුහුණෙහි ශෝභාව දෙස නොව දහම් කැඩපතින් සිරුරෙහි පිළිකුල බලන්න.

<u>සම්පාදක:</u> පොල්ගස්ඕවිට විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසී
පූජ්‍ය පිළියන්දල අතුලසිරි ස්වාමීන් වහන්සේ.

<u>ධර්මදානය:</u> පින්වත් දයාසීලී උපාසිකා මාතාව හා උපේක්ෂා පියරංගිකා මෙනෙවිය විසින් අභාවප්‍රාප්ත ඥාතීන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිසත් තමන්ට ධර්මාවබෝධය පිණිසත් මෙම ධර්මදානය සිදු කරන ලදී.

❖ *අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ධර්ම දේශනා ඇතුළු පටිගත කරන ලද ධර්ම දේශනා සහ පසුගිය දහම් ලිපි* **www.sadaham.net** *යන වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකි ය.*

**Copyright © Sri Saddharma Sansadaya, Dhammarama Yogashramaya - 2007**